# ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය

## <u>2014 දැයට කිරුළ  සංවර්ධන වැඩසටහන</u>

2014 දැයට කිරුළ  සංවර්ධන වැඩසටහන හා සමගාමීව පවත්වනු ලබන බුද්ධිමය දේපළ පිළිබඳ දීප ව්‍යාප්ත රචනා තරඟය සහ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය සඳහා නිල ලාංඡනයක් නිර්මාණය කිරීමේ තරඟය සඳහා ඉදිරිපත් වීමට කැමති අයගෙන් පහත පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.

1. <u>රචනා තරඟය(පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා)</u>

පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර බුද්ධිමය දේපල පිළිබඳ අවබෝධය වර්ධනය කිරීමේ අරමුණින් “ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයෙහි ලා බුද්ධිමය දේපළ ආරක්ෂා කිරීමේ වැදගත්කම” යන මාතෘකාව යටතේ මෙම තරඟය පැවැත්වේ.
ඉහත කී මාතෘකාව යටතේ බුද්ධිමය දේපළ ලෙස ගැනෙන නව නිර්මාණ , කාර්මික සැලසුම්, වෙළඳ ලකුණු, ප්‍රකාශන අයිතිය ආදී විෂයයන් පිළිබඳව සාකච්ඡා කරමින් බුද්ධිමය දේපළ ආරක්ෂාව තහවුරු කර ගැනීම මගින් රටක ආර්ථික සංවර්ධනයට ලැබෙන දායකත්වය පිළිබඳව වචන 1000කට නොඅඩු රචනාවක් ඉදිරිපත් කළ යුතුය.බුද්ධිමය දේපළ යන්නෙන් මිනිසා තම මනස මෙහෙයවා කරනු ලබන ඕනෑම නිර්මාණයක් අදහස්වේ.ඊට සාහිත්‍ය හා කලා නිර්මාණ , තාක්ෂණික නව නිර්මාණ,කාර්මික සැළසුම්,වෙළඳ ලකුණු ආදිය ඇතුලත් වේ.

I. සිංහල,දෙමළ,ඉංග්‍රීසි යන ඕනෑම භාෂා මාධ්‍යයකින් තරඟයට ඉදිරිපත් විය හැක.මාධ්‍ය 3 සඳහා වෙන වෙනම ජයග්‍රාහකයන් තෝරනු ලැබේ.

| | |
|---|---|
| 1 වන ත්‍යාගය | රු.25,000 සහ සහතික පත්‍රය |
| 2වන ත්‍යාගය | රු.15,000 සහ සහතික පත්‍රය |
| 3වන ත්‍යාගය | රු.10,000 සහ සහතික පත්‍රය |

II. සම්පූර්ණ නම , උපන්දිනය, භාෂා මාධ්‍යය, ඉගෙන ගන්නා පාසැල,ශ්‍රේණිය,ස්ව නිර්මාණයක් බවට විදුහල්පතිගේ සහතිකය සහිත අයදුම්පතක් සමඟ රචනාව 30.01.2014 දිනට පෙර එවිය යුතුය.

III. ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ “බුද්ධිමය දේපළ පිළිබඳ දීප ව්‍යාප්ත රචනා තරඟය” ලෙසද ඉදිරිපත් වන මාධ්‍යය ද සඳහන් කර එවිය යුතුය.

IV. ජයග්‍රාහකයන්ට තෑගි සහ සහතික පත් ප්‍රදානය කිරීම 2014 දැයට කිරුළ ප්‍රදර්ශනයේදී සිදු කෙරේ.

- අන්තර්ජාලය භාවිතයෙන් තොරතුරු සොයාගැනීමට සහ බුද්ධිමය දේපළ පනත පිළිබඳ අවධානය යොමු කිරීමට අයදුම්කරුවන්ට යෝජනා කෙරේ.(අපගේ වෙබ් අඩවිය - www.nipo.gov.lk )
- උපුටා ගැනීම් ඒ ආකාරයෙන්ම සඳහන් කිරීම හා වෙනත් නිර්මාණවල තොරතුරු භාවිතා කිරීම තරඟය සඳහා නුසුදුස්සකු වීමට හේතු වේ.

2. <u>ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය සඳහා නිල ලාංඡනයක් නිර්මාණය කිරීම (විවෘත)</u>

I. ඔබගේ නිර්මාණය 10cm x 10cm ප්‍රමාණයට විය යුතු අතර සුපැහැදිලිතාවයෙන් යුක්ත විය යුතුය.

II. රාජ්‍ය ආයතනයක් ලෙස පිළිඹිබු වන ආකාරයට විය යුතුය.

III. නිර්මාණකරුගේ ජීව දත්ත සහිත අයදුම්පතක් සමඟ ස්ව නිර්මාණයක් බවට තමා විසින් සහතික කරමින් 30.01.2014 දිනට පෙර නිර්මාණය එවිය යුතුය.ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ "බුද්ධිමය දේපළ කාර්යාලය සඳහා නිල ලාංඡනයක් නිර්මාණය කිරීමේ තරඟය" ලෙස සඳහන් කර එවිය යුතුය.

IV. තෝරාගනු ලබන නිර්මාණය පිළිබඳ සම්පූර්ණ අයිතිය බුද්ධිමය දේපළ කාර්යාලය සතුවේ.

V. තෝරා ගන්නා නිර්මාණය සඳහා රු.25,000/=ක මුදල් ත්‍යාගයක් පිරිනැමේ. අදාළ ත්‍යාගය සහ සහතික පත්‍ර ප්‍රදානය 2014 දැයට කිරුළ උත්සවයේදී සිදු කෙරේ.

නිර්මාණ එවිය යුතු ලිපිනය:

අධ්‍යක්ෂ ජනරාල්<br>
ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය<br>
400,සමාගම් මැදුර<br>
ඩී.ආර්. විජේවර්ධන මාවත<br>
කොළඹ 10.